(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(5).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 දෙසැම්බර් 09 බදාදා**

**2021 ජනවාරි 05 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

5/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2010 සිට 2018 දක්වා කොළඹ, රත්නපුර, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති ජාතික පාසල්වල 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 සිට 2018 දක්වා ඉහත පාසල්වල —

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කොපමණද ;

(ii) එම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත 6 ශ්‍රේණියට ඇතුළත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 6 ශ්‍රේණියට ඇතුළත් වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ඇතුළත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පාසල්වල වර්ෂ 2010 සිට 2018 දක්වා 6 ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

94/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජෛව අවි භාවිතය ලෝකයේ එකඟතාවය මත තහනම් වුවද විවිධ දේශපාලන හා වෙළඳ උපක්‍රම සඳහා රහසිගතව තවමත් භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාව ඇතුළු ඌන සංවර්ධිත රටවල් මෙම ජෛව අවි අත්හදා බැලීම් සඳහා ඉලක්ක වීමේ ඉඩක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජෛව අවි ප්‍රහාර වළක්වා ගැනීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

116/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවේ දැනට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝව තුළ ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල බස් රථ ඇණි හා මානව සම්පත වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

131/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද මත් කුඩු ප්‍රමාණය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මත් කුඩුවලින් යම් ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් අතට පත්ව තිබෙන බව දන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් යම් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු නාමයන් කවරේද;

(iv) අනාගතයේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

164/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ රජය විසින් ගෙවීමට ඇති, දේශීය හා විදේශීය ණය මුදල්, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ණය ලබාගත් දිනය හා ව්‍යාපෘතීන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම ණය මුදල්වල වාරික ගෙවීම සඳහා රජය විසින් සකසා ඇති වැඩපිළිවෙළ කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

219/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව ශ්‍රී ලංකාවට ආනයනය කළ රසායනික ද්‍රව්‍ය/ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(ii) එම රසායනික ද්‍රව්‍ය/භාණ්ඩ ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම රසායනික ද්‍රව්‍ය/භාණ්ඩ ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට රසායනික ද්‍රව්‍ය/භාණ්ඩ ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

415/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ළමා හා තරුණ තැනැත්තන් පිළිබඳ ආඥාපනතට අදාළව තීන්දු ලබාදීමට නියමිත නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) බාල අපරාධ සම්බන්ධ වැරදිකරුවන්ට සහ ළමා ආරක්ෂාවට අදාළ නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) පැමිණිල්ල සිදුකළ අවස්ථාවේ සිට නඩුව විසඳා අවසන් වීම දක්වා ගතවන සාමාන්‍ය කාල සීමාව කොපමණද;

(iv) ප්‍රමාදයන් සඳහා හේතු, ප්‍රමාදයන් සිදුවන්නේ කුමන අවස්ථාවන්වලදී ද සහ නඩු ඇසීම වේගවත් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(v) ළමයින් උසාවි වෙත ප්‍රවාහනය කිරීමට සකසා ඇති වැඩපිළිවෙළ කුමක්ද;

(vi) උසාවිය තුළදී ළමයින්ගේ ආරක්ෂාව සහ යහපත සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 සිට 2020 දක්වා කාලය තුළ බාල අපරාධ සම්බන්ධ වැරදිකරුවන් සම්බන්ධයෙන්;

(i) අවසන් කළ නඩු ප්‍රමාණය කොපමණද;

(ii) පැමිණිල්ල වාර්තා වූ අවස්ථාවේ සිට චෝදනා ගොනුකිරීම සහ චෝදනා ඉදිරිපත් කර නඩුව අවසානය දක්වා ගතවන කාල සීමාව කොපමණද;

(iii) චෝදනාවලට වැරදිකරුවන් වූ, නිදොස් කොට නිදහස් කරනු ලැබූ සහ මුදාහරිනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා තව දුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගය මේ වනවිට ඉදිකරමින් පවතින බවත්;

(ii) එම අධිවේගී මාර්ගයේ කොටසක් අලව්ව හා නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ඉදිකරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඉහත ප්‍රදේශවල ජීවත්වන පවුල්වලින් අත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම අත් කර ගැනීම් වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කර තිබේද;

(iii) නොඑසේ නම්, සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

457/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගල්කිරියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ, ගල්කිරියාගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි වසමේ, මාතෘ සායනයක් පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බවත්;

(ii) ඉහත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ඇති, කිසිදු පහසුකමක් නොමැති කුඩා කාමරයක මේ වනවිට මෙම සායනය පවත්වන බවත්;

(iii) ඒ හේතුවෙන්, ගැබිනි මව්වරුන් අසීරුතාවයට පත්ව ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) මෙම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ගල්කිරියාගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි වසම සඳහා මාතෘ සායන මධ්‍යස්ථානයක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

526/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පාසලේ මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුරු පුරප්පාඩු කඩිනමින් පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

551/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල යෝජනා ක්‍රම;

(ii) එම ග්‍රාමීය ජල යෝජනා ක්‍රම තුළින් ප්‍රතිලාභ ලබන පවුල්;

සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට අවශ්‍ය කරන ග්‍රාමීය ජල යෝජනා ක්‍රම පිළිබඳව සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ජල යෝජනා ක්‍රම අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරි වසම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ග්‍රාමීය ජල යෝජනා ක්‍රම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

601/2020

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ග —

(i) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතියට මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය කළ යුතු ඉතිරි මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබූ දිනය කවරේද;

(v) ව්‍යාපෘතියට අදාළව පසුගිය රජය සමයේ සිදුවූ අක්‍රමිකතා/ප්‍රමාදයන් හේතුවෙන් එය අවසන් කළ හැකි යැයි අනුමාන කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු —

(i) භාර දී ඇති සමාගම්වල නම් කවරේද;

(ii) ප්‍රමාද කොට ඇති සමාගම්වලට එහි ඉදිකිරීම් කටයුතු නැවත පවරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියේ මහනුවර නගරයට ආසන්න අවසන් පිවිසුම ඇති ප්‍රදේශය කවරේද;

(ii) මහනුවර සිට ගලගෙදර දක්වා වූ මාර්ගයේ පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් ඒ ඔස්සේ අධිවේගී මාර්ගයට පිවිසීමට විනාඩි 30 - 45 අතර කාලයක් ගත වන බැවින් මහනුවර ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් අධිවේගී මාර්ගයට ප්‍රවිශ්‍ය වීමට පිවිසුම් මාර්ග සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම අධිවේගී පිවිසුම් ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

720/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 වර්ෂයෙන් පසු විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන් සඳහා 2020.01.01 දින සිට වැඩිවීමට නියමිතව තිබූ සංශෝධිත වැටුප ගෙවීම අත්හිටුවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂය සඳහා වන අතුරු සම්මත ගිණුම මඟින් එම වැඩිවීමට නියමිතව තිබූ සංශෝධිත වැටුප ගෙවනු ලබන්නේද;

(ii) එසේ නම්, එම වැටුප ගෙවීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

(iii) 2020.01.01 දින සිට ගෙවිය යුතු හිඟ වැටුපද ඔවුනට ගෙවීමට අපේක්ෂා කරන්නේද;

(iv) එම සංශෝධිත වැටුප ලබා දිය යුතු විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

730/2020

අමරකීර්ති අතුකෝරළ මහතා, — ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (1)

(අ) ශ්‍රී ලංකාවේ —

(i) වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ අවශ්‍යතාවය කොපමණද;

(ii) ඉහළම මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් ලබා දෙන දිස්ත්‍රික්කය කවරේද;

(iii) එම කර්මාන්තයේ නියැලෙන මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ජීවිකාව කර ගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

(iii) එම කර්මාන්තය සිදුකරන වැව් හා ජලාශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් හා ජලාශවලට මුදාහරින ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ එම වැව් හා ජලාශවලින් ලද අස්වැන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුදා හරින ලද මත්ස්‍ය පැටවුන්ට සාපේක්ෂව ලද අස්වැන්න පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) කුඩා වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2020

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාකිස්ථානය, නේපාලය, බංගලිදේශය, මාලදිවයින හා මියන්මාරය ඇතුළු 80 කට අධික රටවල් සංඛ්‍යාවක් කොවිඩ්-19 වසංගතයෙහි ආර්ථික බලපෑම හමුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) වෙතින් හදිසි අවස්ථා ආධාර ලබා ගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ආධාර ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, ඉල්ලා ඇති ආධාරවල ස්වභාවය කෙබඳුද;

(iii) ඉහත සඳහන් ආධාර ඉල්ලූ දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ඉල්ලීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රතිචාර දක්වා තිබේද;

(v) එසේ නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිචාරය කවරේද;

(vi) මේ දක්වා සහන ලැබී ඇති රටවල් 80 ට මෙන් ශ්‍රී ලංකා රජයට සහන ලැබී නොමැති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

---

**2021 ජනවාරි 06 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

23/2020

ගරු හේෂා විතානගේ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට අයත් එක් එක් ආයතනවල වාර්ෂික ආදායම සහ වාර්ෂික වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට බඳවාගත් සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය තුළ;

(i) නිදහස් මාධ්‍ය කලාවක් ඇති කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග;

(ii) චෝදනාවලට ලක්වූවන්ට එරෙහිව ගෙන ඇති පියවර;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

109/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.01 දින සිට 2019.12.31 දක්වා වූ කාලය තුළ ආනයනය කරන ලද දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කළ මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ආනයනය කළ ඉහත දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටලවලින් ඇතැම් ඒවා ශ්‍රී ලංකාවේ ධාවනයට නුසුදුසු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, ඉහත දුම්රිය මැදිරි, දුම්රිය එන්ජින් සහ බලවේග කට්ටල මෙරටට ආනයනය කිරීමේ ක්‍රියාදාමය වෙනුවෙන් පත් කරන ලද ටෙන්ඩර් හා තාක්ෂණික කමිටුවල සාමාජිකයන්ගේ නම් හා තනතුරු;

(ii) ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය ආරම්භ කරන දිනය කවරේද;

(ii) ඒ අනුව, රජයට ඉතිරිකර ගත හැකි මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

117/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කළ/කරන එක් එක් නිලධාරියාගේ ලිපිනය සහ නිලධාරියාට මාසිකව ගෙවන ලද වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ඔවුන් ලැබූ වැටුප් හා වෙනත් වරප්‍රසාදවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට ඔවුන්ගේ පාලන කාලය තුළ සමත් වී නැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තවදුරටත් වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

132/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති රජය සතු සහල් ගබඩා කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටි ස්ථාන කවරේද;

(iii) 2015 සිට මේ දක්වා එම එක් එක් මධ්‍යස්ථානයේ ගබඩා කරනු ලැබූ සහල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම මධ්‍යස්ථාන අතරින් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අත්හැර දමා ඇති මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

(vi) එම මධ්‍යස්ථාන නැවත විවෘත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

543/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවා ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවා ගත් තනතුරු නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ජාතික පාසල සඳහා බඳවා ගත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

552/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික පාසල් හා පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ජාතික පාසල් සහ පළාත් සභා පාසල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් පාසලේ මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

561/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අලව්ව දුම්රිය ස්ථානයේ සංවර්ධනයට අදාළ ඉදිකිරීම් වසර ගණනාවක් තිස්සේ ප්‍රමාද වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලව්ව දුම්රිය ස්ථානයේ සංවර්ධනයට අදාළ ඉදිකිරීම් සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) එම ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන ආයතනයේ නම කවරේද;

(iii) එම ඉදිකිරීම් කඩිනමින් අවසන් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

761/2020

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල ඩිපෝව මඟින් බදුල්ල සිට දෙමෝදර හරහා වේවැල්හින්න දක්වා, බදුල්ල සිට මඩුල්සීම, කුරුවිගොල්ල හරහා කොකාගල දක්වා, බදුල්ල සිට රොකතැන්න දක්වා සහ බදුල්ල සිට රොසට් දක්වා ධාවනය කරන ලද බස්රථ මේ වනවිට ධාවනය නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ii) මේ හේතුවෙන් වතු ආශ්‍රිත ප්‍රදේශවල පාසල් ළමුන් සහ විවිධ අවශ්‍යතා සඳහා බදුල්ල නගරයට පැමිණෙන ජනතාව දැඩි අපහසුතාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බස්රථ සේවාවන් නැවත ධාවනය කරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එම සේවාවන් නැවත ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජනවාරි 07 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

24/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019 වර්ෂයේදී සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන්;

(i) මියගිය අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) තුවාල ලැබූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රහාරයෙන් තුවාල ලත් සහ දිගු කාලීන ප්‍රතිකාර අවශ්‍ය පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ හඳුනාගත් පුද්ගලයන්ට ලබාදෙන වෛද්‍ය හා අනෙකුත් ආධාර කවරේද;

(iii) මෙම ප්‍රහාරය හේතුවෙන් පූර්ණ වශයෙන් ආබාධවලට ලක්වූවන්ට විශේෂ ආධාර වැඩපිළිවෙළක් හඳුන්වා දී තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) (i) මෙම ප්‍රහාරයේ වින්දිතයන්ට මේ වනවිට ලබා දී ඇති වන්දි හා ප්‍රදානයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම ප්‍රහාරයෙන් ජීවිත අහිමි වූ පුද්ගලයන්ගේ යැපෙන්නන් සඳහා දිගුකාලීනව ලබාදීමට බලාපොරොත්තු වන සහන කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

133/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රවිනාථ ආරියසිංහ මහතා ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනය හා විශ්‍රාම ගිය දිනය කවරේද;

(ii) ඔහු විසින් දරන ලද තනතුරු කවරේද;

(iii) ඔහුව නැවත විදේශ අමාත්‍යාංශයේ සේවයට බඳවා ගැනීමේ සැලැස්මක් තිබේද;

(iv) එසේ නම්, ඒ හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවාවේ සිටින තරුණ නිලධාරීන්ට අසාධාරණයක් සිදු වන බව පිළිගන්නේද;

(v) මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

167/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ සිදු කරන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

185/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ, තමිල්වෝලෙ විද්‍යාලය නමින් පාසලක් ක්‍රියාත්මක වූ බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසල ආරම්භ වූ දිනය කවරේද;

(iii) ඉහත තමිල්වෝලෙ විද්‍යාලයෙන් අවසන්වරට අ.පො.ස. (සා/පෙළ) විභාගයට සහ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයට සිසුන් ඉදිරිපත් වූ වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් පාසල හඳුන්වනු ලබන නම කවරේද;

(ii) දැනට මෙම පාසල සඳහා භාවිතාවන නම කවුරුන් විසින් කවර හේතුවක් නිසා කවර දිනයක වෙනස් කරනු ලැබුවේද;

(iii) මෙලෙස නම වෙනස් කිරීම මඟින් මෙම පාසලෙහි නිර්මාතෘවරයා හෝ ස්ථාපනය කළ පුද්ගලයා යන නම ලබා ගැනීමට යමෙකුට හැකියාව තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

226/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ රබර් ප්‍රමාණය කොපමණද;

(ii) එම රබර් ආනයනය කළ රටවල් කවරේද;

(iii) එම රබර් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට රබර් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

263/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2018-2019 මහ කන්නයේදී ගංවතුර උවදුර හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ වගා හානි වූ බවත්;

(ii) මේ වනතෙක් ඒ සඳහා වන්දි මුදල් ගෙවා නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් ගොවීන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කන්නය තුළදී මාතර දිස්ත්‍රික්කයේ හානි වූ වගා බිම් ප්‍රමාණය;

(ii) වන්දි මුදල් ගෙවිය යුතු ගොවීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙතෙක් වන්දි මුදල් නොගෙවීමට හේතු කවරේද;

(ii) උක්ත වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

425/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට ඉදිකරමින් පවතින වයඹ ඇල ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා අත්කර ගත් සින්නක්කර ඉඩම් හිමියන් සඳහා වන්දි ගෙවීම අක්‍රමවත් බවත්;

(ii) විහාර සන්තක ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී, එම ඉඩම් භුක්තිවිඳින්නන් සඳහා ගෙවනු ලබන වන්දි ප්‍රමාණවත් නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සඳහා සාධාරණ පරිදි වන්දි මුදල් ලබාදීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මේ වනවිට ඉදිකිරීම් කරනු ලබන රංවැඩියාව කොටසේ ඇළෙහි ගැඹුර අඩි 40කට වඩා වැඩිවීම හේතුවෙන් ඒ අවට පානීය ළිං හා කෘෂි ළිං සිඳී යාමෙන් ජනතාව දැඩි පීඩාවට පත්වී ඇති බවත් පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ජනතාව සඳහා කඩිනමින් විසඳුම් ලබා දෙන්නේද;

(iii) එම විසඳුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

484/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ මේ වනවිට ඇති වාරිමාර්ග යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් වාරිමාර්ග යෝජනා ක්‍රමයෙන් දේශීය කෘෂි ආර්ථිකයට ලැබෙන දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වාරිමාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිතව සිය ජීවන වෘත්තිය සලසා ගනු ලබන ජනතාවගේ ගැටලු විසඳීමට හා ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

527/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි එක් එක් ජාතික පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, අදාළ තනතුරු නාමයන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

553/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික මාර්ග, පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මාර්ග අතරින්—

(i) කාපට් අතුරා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(ii) තාර දමා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(iii) තාර දමා හෝ කාපට් අතුරා නොමැති මාර්ගවල දුර ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ග්‍රාමීය මාර්ග ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

562/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය වැඩි දියුණු කළ යුතු බවත්;

(ii) දේශීය හා විදේශීය සංචාරකයන් ආකර්ෂණය කරගැනීම සඳහා ජාතික උරුමයන් උපයෝගී කරගත යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි රාජධානි 04 සංචාරක කටයුතු සඳහා යොදා ගැනීමට මේ වනවිට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) දඹදෙණිය රජමහා විහාරය හා දඹදෙණිය රාජධානිය සංචාරක සිතියමට ඇතුළත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

757/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසිමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) වන අලින්ගේ සංචරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) වන අලින් වැඩි වශයෙන් සංචරණය කරන ජාතික වනෝද්‍යාන හා රක්ෂිත වනාන්තර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අලි කොරිඩෝ තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) අලි කොරිඩෝ හරස්වන ආකාරයට ගම්මාන හෝ ජනතාව පදිංචි ස්ථාන තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2020 සැප්තැම්බර් දක්වා දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුමෙන්;

(i) මියගිය පුද්ගලයන් හා වන අලින් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) හානි වී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iii) මියගිය හා දේපළ අහිමිවූවන්ට ගෙවා ඇති වන්දි මුදල එක් එක් පුද්ගලයා අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ගත් නව ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

762/2020

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි වතු ආශ්‍රිත රෝහල් සංඛ්‍යාව;

(ii) ඒ අතරින් රජයට පවරාගෙන සංවර්ධනය කර ඇති වතු රෝහල් සංඛ්‍යාව;

(iii) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින වතු රෝහල් සංඛ්‍යාව;

(iv) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින වතු රෝහල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට රජයට පවරාගෙන ඇති වතු රෝහල් සඳහා වෛද්‍යවරු, සෙසු කාර්ය මණ්ඩල සහ වෛද්‍ය උපකරණ ඇතුළු පහසුකම් සපයා තිබේද;

(ii) මෙම වතු රෝහල් සඳහා ගිලන් රථ ලබා දීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින හා නොපවතින වතු රෝහල් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) සියලුම වතු රෝහල් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

875/2020

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනිකුත් රජයන් සහ බහුපාර්ශ්වික ආයතන ආදිය වෙතින් ණය පමා සහනයක් ඇතුළුව ණය සහනයන් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඉල්ලීම් කිහිපයක් සිදුකර තිබේද ;

(ii) එසේනම්, ණය පමා සහනය ඇතුළුව ණය සහන සඳහා ශ්‍රී ලංකා රජය විසින් මේ දක්වා සිදුකර ඇති ඉල්ලීම්වල ස්වභාවය කවරේද:

(iii) ඉහත කී ඉල්ලීම් සිදුකරන ලද දිනය කවරේද;

(iv) ඉහත කී ඉල්ලීම් සඳහා ලැබී ඇති ප්‍රතිචාර කවරේද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රජය වෙත අනුමත ප්‍රදානවලින් ලැබීමට ඉතිරිව ඇති ප්‍රදාන කවරේද;

(ii) ඉහත කී ප්‍රදානයන්ගේ වටිනාකම කොපමණද;

(iii) ශ්‍රී ලංකා රජය විසින් ඉහත කී ප්‍රදානයන් භාරගෙන නොමැත්තේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද ?

879/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දේශපාලන සිරකරුවන් සිටින්නේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ජාතීන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතරින් වැඩිම කාලයක් සිරගතකර සිටින සිරකරුවාගේ නම කවරේද;

(iv) එම සිරකරුවා සිරගතකර මේ වනවිට ගත වී ඇති කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ත්‍රස්තවාදී කටයුතුවලට සම්බන්ධ සිරකරුවන් සිටින්නේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ජාතීන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතරින් වැඩිම කාලයක් සිරගතකර සිටින සිරකරුවාගේ නම කවරේද;

(iv) එම සිරකරුවා සිරගතකර මේ වනවිට ගත වී ඇති කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධ සැකකරුවන්ගේ නඩුවලට අදාළ කටයුතු කඩිනම්කර ඔවුන්ට යුක්තිය ඉටු කිරීමට පියවර ගන්නේද;

(ii) ත්‍රස්තවාදී කටයුතු සඳහා බලහත්කාරයෙන් බඳවා ගත් ළමුන් පුනරුත්ථාපනය කර නැවත සමාජ ගත කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජනවාරි 08 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

25/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ධාවනයෙන් ඉවත් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි අතරින් අලුත්වැඩියා කර නැවත ධාවනයට එක් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) එම දුම්රිය මැදිරි අලුත්වැඩියා කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ධාවනයෙන් ඉවත් කරන ලද සෙසු දුම්රිය මැදිරි යළි ධාවනයට එක් කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

134/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විදේශගත රාජ්‍ය දූත මණ්ඩලවල සේවයේ නියුතු වාණිජ දෙපාර්තමේන්තුවේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, තනතුරු නාමය, සේවයේ නියුතු දූත මණ්ඩලයේ නම සහ රැකියාවේ වගකීම් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) එම නිලධාරීන්ගෙන් ශ්‍රී ලංකාවට සිදුවන සේවය ගැන අමාත්‍යාංශය තෘප්තිමත්ද වන්නේද;

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට එම නිලධාරීන්ගෙන් ඉහළ දායකත්වයක් ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය සතු දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

171/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝලෙවල් මාර්ගයේ අඹතලේ සිට ඔරුගොඩවත්ත දක්වා කොටසේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොමැති බව දන්නේද;

(ii) එසේනම්, එම මාර්ගය සංවර්ධනය කිරීම ප්‍රමාද වීමට හේතුවන කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ මේ වනවිට සංවර්ධන කටයුතු නිම කර ඇති ප්‍රමාණය සහ තවදුරටත් නිම කිරීමට ඉතිරිව ඇති ප්‍රමාණය;

(ii) මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් දේපල අහිමිවූවන් අතරින් මේ වනවිට වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ වන්දි මුදල;

(iii) තවදුරටත් වන්දි ලබා දීමට ඉතිරිව ඇත්නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, වන්දි මුදල සහ එම වන්දි ලබා දීමට අපේක්ෂිත දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

264/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත අනුව විශ්වවිද්‍යාල විද්‍යායතන, උපාධි පිරිනමන ආයතන බවට පිළිගෙන ඇති බවත්;

(ii) එහෙත් දැනට මෙම ආයතන විසින් උපාධිය වෙනුවට උසස් ඩිප්ලෝමාවක් පමණක් ලබාදෙන වසර තුනක පාඨමාලා පවත්වන බවත්;

(iii) උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍ය දේශන ශාලා, පුස්තකාල, කථිකාචාර්යවරුන් හා වෙනත් පහසුකම් මෙම ආයතනවල නොමැති බවත්;

(iv) මේ හේතුවෙන් අධ්‍යාපන කටයුතු සිදුකර අවසන් වූ හා දැනට අධ්‍යාපන කටයුතුවල නිරත වන සිසුන්ගේ අනාගතය අවිනිශ්චිත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගැටලු කඩිනමින් විසඳීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම ගැටලු විසඳීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

458/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර සිට කුරුණෑගල නගරයට ලගාවිය හැකි කෙටිම මාර්ගය බුල්නෑව - පොල්පිතිගම මාර්ගය බවත්;

(ii) එම මාර්ගයේ තලාව හංදියේ සිට පොල්පිතිගම හංදිය දක්වා වූ කොටස මේ වනවිට අබලන් තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

519/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාලච්චේන ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හැසිරවිය හැකි වුවත්, විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හැසිරවීම සඳහා එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

595/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටා ඇති එකම රෝහල වන ඩෙල්ෆ්ට් රෝහලේ අනුමත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර කවරේද;

(ii) පසුගිය වර්ෂ 08ක කාලය තුළ එම රෝහලට ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(iii) වෛද්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් ඩෙල්ෆ්ට් දූපතේ ජීවත්වන දිළිඳු ජනතාව මුහුණදෙන දුෂ්කරතා කවරේද;

(iv) එම ජනතාවට විශිෂ්ට වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා ඩෙල්ෆ්ට් රෝහලේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

606/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2019.04.08 දින පළ කරන ලද දැන්වීම, 2019 වර්ෂයේදී අ.පො.ස. (උ/පෙළ) විභාගයට (නව සහ පැරණි විෂය නිර්දේශ යටතේ) පෙනී සිටි සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමේ පදනම වන්නේද;

(ii) ඉහත දැන්වීමෙහි දක්වා ඇති විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වන ක්‍රමවේදයේ වෙනසක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම වෙනස්කම් සිදු කිරීම සාධාරණීකරණය කරන්නෙ කෙසේද;

(iv) එම වෙනස්කම් සඳහා ඉඩ සලසා දෙන ආකාරය කවරේද;

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පැරණි සහ නව විෂය නිර්දේශය යටතේ විශ්වවිද්‍යාලවලට බඳවා ගනු ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව තීරණය කිරීමේදී අදාළ කර ගන්නා ක්‍රමවේදය සහ එය යොදා ගනු ලබන ආකාරයද ඇතුළුව විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධ සියලු විස්තර ප්‍රසිද්ධ කරන්නේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද?

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

609/2020

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1818 සහ 1819 වර්ෂවලදී සිදු වූ ඌව-වෙල්ලස්ස සටනට හම්බන්තොට ප්‍රදේශයෙන් නායකත්වය දුන් විරුවන් පිළිබඳ තොරතුරු, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නොමැති වීම සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ නිලධාරියෙකු විසින් සිදු කරනු ලබන පර්යේෂණයේ ප්‍රගතිය කවරේද;

(ii) එම විරුවන් රාජද්‍රෝහීන් ලෙස නම් කර ඇති බවට තොරතුරු ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම විරුවන්, ජාතික වීරවරයන් ලෙස නම් කිරීම සුදුසු බවට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් යෝජනා කර ඇති බව එවකට ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) වෙත යොමු කළ 2020.01.14 දිනැති ලිපියේ සඳහන් වන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

640/2020

ගරු රවුෆ් හකීම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ පිහිටි බප / කො / ජයන්ති විද්‍යාලය, ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් ළමයින් අධ්‍යාපනය හදාරන, 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වෙන පාසලක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසලේ වර්තමාන තත්ත්වය සොයා බැලීම සඳහා වගකිවයුත්තන් අවසන් වරට එම පාසල නිරීක්ෂණය කළ දිනය කවරේද;

(ii) පාසල වටා ඇති අනතුරුදායක තාප්පය ප්‍රතිසංස්කරණය කිරීම, අභ්‍යන්තර කාණු පද්ධතිය, ගොඩනැගිලි දැල් ආවරණය, අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය, ජල සහ විදුලි පද්ධතිය, පන්ති කාමර, වැසිකිලි හා කැසිකිලි පහසුකම්, පරිගණක යන්ත්‍ර අවශ්‍යතා, ගුරු නිහය හා මුරකරු තනතුරක පවතින නිහය ආදී අවශ්‍යතා සම්බන්ධයෙන් අවධානය යොමු කරන්නේද;

(iii) එසේ නම්, එම පාසලේ දීර්ඝ කාලයක් තිස්සේ පවතින එකී අඩුපාඩු සපුරාලීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

731/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන බවත්;

(ii) අනුරාධපුරය හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල පවතින වියළි කාලගුණය අවසන්ව නැවත වැසි ලැබීමත් සමග මදුරු ගහනය වර්ධනය වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මේ වනතෙක් ඩෙංගු රෝගයට ගොදුරුවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු උවදුර මර්දනයට රජය විසින් ගෙන ඇති ක්‍රියාමර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඩෙංගු මදුරු කීටයන් විනාශ කිරීමට 2008/2009 වකවානුවේදී එවකට පැවති රජය විසින් B.T.I. බැක්ටීරියාව කියුබාවෙන් ආනයනය කිරීමට විවිධ උත්සාහයන් ගත් නමුත් එය අසාර්ථක වූ බවත් එතුමිය දන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර තිබේද;

(ii) ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා B.T.I. බැක්ටීරියාව භාවිතා කිරීමට හැකියාවක් නොමැති නම්, එයට හේතු කවරේද;

(iii) B.T.I. බැක්ටීරියාව වෙනුවට ඩෙංගු මදුරුවන් මර්දනයට භාවිතා කළ හැකි විකල්පය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

775/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඳුරුවෙල නගරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ විශේෂ ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීමට කුඹුරු සහ ගොඩ ඉඩම් රජයට පවරාගෙන තිබේද;

(ii) එසේ නම්, එම කුඹුරු සහ ගොඩ ඉඩම් ප්‍රමාණය, හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවරාගත් ඉඩම් වෙනුවෙන් වන්දි ලබා දී තිබේද;

(ii) එසේ නම්, එක් එක් පුද්ගලයාට ගෙවන ලද වන්දි මුදල, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන දුම්රිය මාර්ගය දෙපස සම්පූර්ණයෙන්, අර්ධ වශයෙන් හෝ කොටසක් පමණක් කඩා ඉවත් කළ ව්‍යාපාරික ස්ථාන තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපාරික ස්ථානවල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම හිමිකරුවන් සඳහා රජයෙන් වන්දි ලබා දී තිබේද;

(iv) එසේ නම්, එක් එක් පුද්ගලයාට ගෙවන ලද වන්දි මුදල, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයන් සඳහන් කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්. ඒ මන්ද?

852/2020

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලෝක බැංකු ආධාර යටතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද;

(ආ) (i) එම ව්‍යාපෘතිය ආරම්භ කළ හා අවසන් කිරීමට නියමිත වර්ෂ කවරේද;

(ii) ව්‍යාපෘතියේ දිස්ත්‍රික් කාර්යාලයක්, රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථාපනය කර තිබේද;

(iii) එහි කාර්ය මණ්ඩලය කොපමණද;

(iv) ඒ සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් සහ බාහිරින් බඳවාගෙන ඇති නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) බාහිරින් සේවකයන් බඳවාගෙන ඇති පදනම කවරේද;

(vi) ඉහත ආයතනය විසින් කුලී පදනම මත ගත් වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) මේ වනවිට එම ව්‍යාපෘතියේ පරිපාලන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතියෙන් මේ වනවිට ක්‍රියාත්මක ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

(iii) ඉදිරියේදී ක්‍රියාත්මක කරන ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව;

(iv) ඒ සඳහා ඇස්තමේන්තු ගත මුදල;

(v) එම ව්‍යාපෘතිය මඟින් සනීපාරක්ෂක පහසුකම් ලබාදී ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහ ඒ සඳහා වැයවී ඇති මුදල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

876/2020

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිදහස ලැබුණු දින සිට ණය ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් නොකැළැල් ඉතිහාසයක් පවත්වාගෙන යමින් සිටින ලද බව ශ්‍රී ලංකා රජය විසින් නොකඩවා ප්‍රකාශ කරන ලද බවත්;

(ii) මූඩි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ණය ආපසු ගෙවීමේ හැකියාව B2 සිට Caa1 දක්වා මට්ටම් දෙකකින් පහත දමා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද ?

(ආ) (i) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ පොලී සහ ක්‍රමක්ෂය ගෙවීම් වල මුළු වටිනාකම කවරේද ;

(ii) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත අයවැය හිඟය කවරේද ;

(iii) 2020 වර්ෂයේ පළමුවන, දෙවන හා තුන්වන කාර්තු සඳහා රජයේ ආදායම කවරේද;

(iv) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා පුරෝකථනය කරන ලද සමස්ත ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ණය ගෙවීම පැහැර හැරීම වැළැක්වීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව විසින් තම ණය ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය වෙත ඇතිවන බලපෑම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

881/2020

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික මත්ස්‍ය අවශ්‍යතාවය කොපමණද;

(ii) එම අවශ්‍යතාවයෙන් දේශීයව නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1982 වර්ෂයේදී උතුරු සහ නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනය, ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති යුදමය තත්ත්වය අවසන්ව මේ වනවිට අවුරුදු 11ක් ගත වුවද, 1982 වර්ෂයේදී එම පළාත්වලින් ලද මත්ස්‍ය අස්වැන්න මේ වනවිට නොලැබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු පළාතේ හඳුනාගත් ප්‍රදේශවල මේ වනතෙක් ධීවරවරායන් ඉදිනොකිරීමට හේතු කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ අනෙකුත් පළාත්වල ඉදිකරන ලද ධීවර වරායන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේදුරුතුඩුව ධීවර වරාය ඉදිකිරීමේ ප්‍රගතිය කවරේද;

(iv) මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු ආධාරවල ස්වභාවය සහ එම ආධාර මේ වනවිට නවතා දැමීමට හේතු කවරේද;

(v) නෝර්වේ සහ ඩෙන්මාර්ක් රටවලින් ලබා දෙන ණය මඟින් මෙම වරාය ඉදිකිරීමට හේතු කවරේද;

(vi) එමඟින් ලැබෙන අමතර ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?